තාරකා විජිතයක විසිතුරු

ජගත් ජේ. එදිරිසිංහ ගේ තාරකා විජිතය නවකතාව පිළිබඳ විවරණකි

සතියේ දිනවල උදෑසනම අපි අවදිවෙමු. දරුවන් පාසලට යවමු. ළඟ ලැහැත්ති වී සේවයට යමු. ඩොලර් කිහිපයක් සඳහා දිවා කාලය කඹුරමු. සවස් වී නිවසට එමු. කා බී මෝඩයාගේ පෙට්ටිය ඉදිරියේ කාලය ගතකොට හෙට දවසේ ද මේ කර්තව්‍යයේ ම නිරතවන්නට ඇති බව මෙනෙහි කර දුක්මුසු සිතින් නින්දට වදිමු. අප සති අන්තය ගත කරන අයුරුද මෙලෙසම පුර්ව නිගමනය කෙරී ඇත. අපටම කඩේ යාම, ගෙදර දෙර පිරිසිදු කිරීම, තණකොළ කැපීම, දරුවන් ට රැක්සි සේවා සැපයීම ඒ සති අග තිති පිළිවෙත වේ.
අපේ ජීවිත කතා, නවකතාවලට වස්තු බීජ නොමසපයන්නේ මේ ඒකාකාරීබව නිසාය. නවකතා ලියවෙන්නේ අසාමාන්‍ය ජීවිත ගතකරන, අසාමාන්‍ය මිනිසුන්ගේ, අසාමාන්‍ය ජීවන අත්දැකීම් පසුබිම් කරගෙන බව පැහැදිලිය.

මා පසුගියද කියවූ ඕස්ට්‍රේලියානුවාසි සිංහල ලේඛක ජගත් ජේ. එදිරිසිංහ ගේ සිව්වන මුද්‍රිත නවකතාව වන " තාරකා විජිතය" එවැනි අසාමාන්‍ය අන්තර්ගතයක් රැගත් නවකතාවකි.
කාලයක් තිස්සේ මෙල්බර්න් නගරයේ වෙසෙමින්, නවකතාකරුවෙකු, කවියෙකු, සඟරා සංස්කාරකවරයෙකු, කවියෙකු, ගුවන් විදුලි ශිල්පියෙකු සහ තිරනාටක රචකයෙකු ලෙස විශාමික සිංහල සාහිත්‍යයට නොමඳ සේවයක් සපයන ජගත් ජේ. එදිරිසිංහ ගේ මුල් නවකතා යුගල වන "අසුර අඩවිය" සහ " ගිම්හාන සුලඟ" මෙන්ම "තාරකා විජිතය" කෘතියද මුලින් ම ලියවුනේ ද සන්නස පුවත් සඟරාවේ මාසිකව කොටස් වශයෙන් පළකරන්නටය.

කොටස් වශයෙන් පළකෙරෙන නවකතාවක් රචනා කරන ලේඛකයා එහිදී අභියෝග කීපයකට මුහුණ දෙයි. සෑම වාරිකයක් ම ප්‍රමාණයෙන් සීමාසහිත විය යුතු නමුත් ඒ සෑම වාරිකයකම නවකතාවේ ප්‍රමාණාත්මකව සැහෙන කොටසක් අඩංගුවිය යුතුය. වාරිකය අවසාන විය යුත්තේ ඊලඟ කොටස ද නොවරදවා බැඳිමට පාඨක සිත තුළ අවශ්‍යතාවක් ජනිත කරවමිනි. මේ කරුණු සමග ගැටෙමින් නවකතාවක් රචනා කිරීමේදී රචකයාට එහි අන්තර්ගතයේ මෙන්ම ආකෘතියේ ද ගුණාත්මකභාවය ගැන යම් යම් කේවල් කිරීම් කරන්නට සිදුවෙන බව මගේ විශ්වාසයයි. අද සිංහල ටෙලිනාටකයට වී ඇති ව්‍යවසනයෙන් මේ කරුණ හොඳින් පැහැදිලි වෙන බව අපි දනිමු.
තම මුල් නවකතා යුගලය වූ "අසුර අඩවිය" සහ - ගිම්හාන සුලඟ" කෘති රචනයේ දී ජගත් ජේ. එදිරිසිංහ මේ අභියෝගය සාර්ථකව ජයගත්තේය. ඕස්ට්‍රේලියානු සිංහල ප්‍රජාවේ උප ප්‍රධාන අංශ වන, සරණාගතයින් සහ ජාත්‍යන්තර සිසුන් ප්‍රධාන භූමිකා සඳහා උපයෝගී කර ගනිමින් ඔවුන් ගේ ප්‍රශ්ණ පිළිබඳව සාකච්ඡා කරමින්, මනා සමාජීය විශ්ලේෂණයක් ඉදිරිපත් කරමින් ප්‍රභල අන්තරගතයක්, සාර්ථක ආකෘතියක් මගින් ව්‍යක්තව ජගත් ජේ. එදිරිසිංහ එදා අපට ඉදිරිපත් කළ බව මගේ මතයයි. එසේ නමුදු, "තාරකා විජිතය" නවකතාව රචනයේ දී ඒ තිරසාර පදනම බඳ ගනිමින් රචකයා තම හැකියාවේ යම් පසු බැසීමක් පෙන්නුම් කර ඇත්දෝයි මා සිත තුළ කුකුසක් ඇතිවන බව කිව යුතුය. එය කෙතරම් සාධාරණ විවේචනයක්දැයි මඳක් සොයා බලමු.

"තාරකා විජිතය" නවකතාවේ කතා වස්තුව සැකෙවින් මෙසේය. පවුල් දිවියට වඩා තම ආචාර්ය උපාධියේ පර්යේෂණ මුල්කොට සලකන දිළිප ගේ බිරිඳ ලෙස ඕස්ට්‍රේලියාවේ පස්වසරක් ගතකර සැමියා ගේ අණ කිරීම මත ලංකාවේ නිවාඩුවකට යන නිෂාඳි ඉතිදී ජනප්‍රිය නවක නිෂමා නළුවෙකු වන අනුරාධ හා ලිංගිකව හැසිරී පසුව ඔහු හා පෙමෙන් බැඳේ. රිය අනතුරක් නිසා ඔවුන් දෙදෙනාගේ අනියම් සම්බන්ධය රට තුළ ප්‍රසිද්ධියට පත්වේ. ලංකාවට පැමිණෙන දිළිප ඇගේ නොකමැත්ත නොසලකා නිෂාඳිව නැවත මෙල්බර්න් රැගෙන යයි. එහිදී නිෂාඳි අනුරාධ නිසා ගැබ්ගෙන ඇති බව දැනගත් පසුවද දිළිප ඇය අතහැර නොදමන්නට තීරණය කරයි. එය නොතකා දිළිප හැර යන නිෂාඳි පසුව තමන් රඟන සිනමා පටයක් තිරගත කිරීමට ඕස්ට්‍රේලියාව එන අනුරාධ සමග නැවත එක්වේ. ඒ අනුරාධව මරා දමා තමා ද මිය යාමට දිළිප කරන සැලසුම ඔහුගේ දුර්වල සිත නිසා ව්‍යවර්ථ වීමෙන් අනතුරුවය.

ප්‍රථමයෙන්ම කිව යුත්තේ "තාරකා විජිතය" නවකතාවේ ඉහත කී අන්තර්ගතය වනාහි සැබෑවීමට අතිශයින්ම අඩු සම්භාවිතාවයන් සහිත සංසිද්ධීන් කිහිපයක සමපාතවීමක් ලෙසින් පමණක් සාධාරණීකරණය කළ හැක්කක් බවයි. තනිව ලංකාවට ගොස් සිටියදී විනෝද ගමනක් යන නිෂාඳි ට අනුරාධ නම් නළුවා හමුවීම, ඔවුන් වචන කිහිපයක් පමණක් කතාබහ කරන දෙවන දිනයේම ලිංගිකව එක්වීම, එක් ලිංගික එක්වීමකින් පමණක් කාන්තාවක් ගැබ් ගැනීම, ඔවුන් එක්ව මෝටර් රථයක යන ප්‍රථම අවස්ථාවේදීම එය අනතුරකට ලක්වීම මේ ආකාරයෙන් සමපාත වී ඇති අසම්භාවී සිද්ධීන් කිහිපයකි.
එපමණකුදු නොව, "තාරකා විජිතය" නවකතාවේ විශ්වාසනීත්වය බිඳෙන තවත් අතාත්වික කරුණු කිහිපයක් ද වේ. ජනප්‍රිය නළුවෙකු වූ අන්සතු තරුණ බිරිඳකට උන්මත්තකව මෙන් ආදරෙන් බැඳීම, පූර්ණකාලීන ආචාර්ය උපාධි අපේක්ෂකයෙක් කිසිදු ආර්ථික ප්‍රශ්ණයක් නැතුවා සේ හැසිරීම, තරුණ සැමියෙකු අනාචාරයේ හැසිර අවජාතක දරුවෙකු ද කුස තුළ දරා සිටින තම බිරිඳ ගේ දැඩි ප්‍රතික්ෂේප කිරීම් ද නොසලකා අයුම පැතීම, උගත් තරුණියක් වසර පහක් පැරණි විවාහයක බැඳී සිටින මිනිසෙකු පැතීම ඒ අතර වේ.
තාත්විකත්වය සොයන විචාරකයෙකු ලෙස මා එලෙස දුටුවද මේ අසාමාන්‍ය සිද්ධීන් සහ තරමක් අතාත්වික ලෙස පෙනෙන හැසිරීම් මාලාවම ජගත් ජේ එදිරිසිංහ ගේ -තාරකා විජිතය" නවකතාව ලාංකික සිංහල නවකතා පාඩකයින් ගේ බහුතරයක ජනප්‍රියත්වයේ හිණිපෙත්තට නැංවෙන්නට හේතුවිය හැකි බව ද මට පෙනේ. වෙනත් වචන වලින් කියනොත් -තාරකා විජිතය" නවකතාවේ අන්තර්ගතය තුළ ජයග්‍රාහීත්වයේ සූත්‍රය ගැබ්ව ඇත.

ඒ සමගම පෙනියන තවත් කරුණක් වන්නේ "තාරකා විජිතය" නවකතාව කෙලින්ම ජනප්‍රිය වර්ටෝරුවේ සිනමා පටයක් කරන්නට හොඳින් ඉඩකඩ තිබෙන බවයි. සුදුම සුදු සේ සහ කළුම කළු සේ බැළු බැල්මට පෙනෙන චරිත, ලෝකාන්තයේ දී සිදුවෙන අහඹු හමුවීම්, නුවර එළියේ දර්ශන, මෝටර් රථ අනතුරු, ගුවන් තොටුපොලේ කෙරෙන සමුගැනීම් සහ මුණ ගැසීම් මෙන්ම මාරාන්තික මෝටර් රථ පැදවීම් ද මෙහිදී සිත් ඇද ගන්නා දර්ශන මවනු ඇත.

කරුණු එසේ වුව ද, මේ ජනප්‍රිය කතාව අති සරලව ඉදිරිපත් කරන්නට ජගත් ජේ. එදිරිසිංහ නවකතාකරුවා තුළ සිටින ව්‍යක්ත ලේඛකයා ඉඩ නොදීම සතුටට කරුණකි. අද ලංකාවේ දුසිම් ගණනින් ප්‍රකාශයට පත්වෙන -මිල්ස් සහ බුන් වර්ගයේ අති සරල නවකතාවල මෙන් නොව - තාරකා විජිතය" නවකතාව පුරාම භාවාත්මක මෙන්ම භාවපූර්ණ දෙබස් සහ ස්වයංභාෂණ මගින් එහි අඩංගු අසාමාන්‍ය චරිතවල අසාමාන්‍ය ක්‍රියාකාරකම් දෙස යම් දුරකට විශ්ලේෂණාත්මකව බැලීමක් සිදුවී ඇති බව කිව යුතුය. එහෙත් එමගින් ආචාර්ය උපාධි ශිෂ්‍ය දිළිප ගේ සංඛර්ණ චරිතය මුළුමනින් සාකච්ඡා නොවීම කණගාටුවට කරුණකි.

අවසාන වශයෙන් සඳහන් කළ යුත්තේ මගේ නිර්ණායකයන්ට අනුව සාපේක්ෂව අඩු තක්සේරුවක් ලැබුනද ජගත් ජේ. එදිරිසිංහගේ "තාරකා විජිතය" නවකතාව සිංහල නවකතා කියවන්නන් ගේ පොදු රසාස්වාදය ඉහල නංවන කෘතියක් බවට සැකයක් නැති බවයි.

රසික සූරියආරච්චි
rasika.suriyaarachchi@gmail.com



නමෝ බුද්ධාය !

මීට වසර දෙදහස් හයසිය තිස් පහකට පෙර භාරත දේශයේ සිද්ධාර්ථ ගෞතම නමින් උපත ලබා, ස්වයංභූඥාණයෙන් ජීවිතයේ සත්‍යය අවබෝධ කරගත් තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත බොදු ජනතාව සරණ ගිය අපගේ ශාස්තෘන්වහන්සේය. සසර කතරින් එතෙර වීමේ ඒකායන මාර්ගය ලෙස එදා දඹදිව් තලයේ විසිරි පැතිරි තිබූ දෙසැටක් මිසදිටු ආගම් අඛියස -ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ" යනාදී වශයෙන් මහත් අභිමානයෙන් සිහ නාද පැවැත් වූ ඒ ශ්‍රී සද්ධර්මය අඳත් ලොව පුරා රැවී පිළිරැවී දෙමින් පැතිර යයි.

බුදු සසුන බබුළුවමින් ධර්ම ප්‍රචාරය සඳහා ලොව දස දෙස ශ්‍රාවකයන් වහන්සේලා පිටත් කර යැවූ ධර්මාශෝක යුගයේ, හෙළ ජාතියේ පිනට ඒ සඳහම් පණිවිඩය රැගෙන සිරිලකට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ, ඒ උතුම් නිර්මල බුද්ධ ධර්මය අප වෙත දායාද කළේ අප කෙරෙහි පැවති අනුකම්පාවෙනි. මේ කාලය ඇතුලත බුදු දහම බැබළුන කාල පරිච්ඡේද මෙන්ම පරිහානියට පත් වූ යුගයන් ද තබූ බව ඉතිහාසයෙන් පැහැදිලි වේ.

කාලයාගේ අඩවෑමෙන්, විදේශ ආක්‍රමණයන්ගෙන් සහ මිසදුටු බ්‍රාන්මන ඇදහීම්, නිර්මල බුදු දහම සමග මිශ්‍ර වූ හමුත් අනාවයට පත් වූයේ නැත. ඒ ඒ යුග වලදී නිර්මල බොදු දහම රැක ගන්නට ගෞරවනීය මහා සංඝරත්නය සහ උගත් ගිහි පින්වතුන් කළ සේවය අමරණීයයි.

මීට දශක පහකට පමණ පෙර කොළඹට නුදුරු රමණීය පරිසරයක පිහිටි කිරිබත්ගොඩ නම් ප්‍රදේශයේ බොදු දහම යන වචනය, වචනයකට පමණක් සීමා වූ, එහි හරය නොදන්නා, අන්‍යාගමික පවුලක පින්වත් දරුවකු උපත ලැබීය.

තිසරණය සරණ යාමෙන් පස් පව් හඳුනා ගැනීමත් සිහිනයක් බඳු වූ එවැනි වටපිටාවක, ජීවනෝපාය ලෙස පස් පවින් තොර සාධාරණ ජීවන රටාවකට යොමු වීමටත්, මුදලට වඩා අගය කල යහපත් ගති ගුණ නුරු පුරුදු වීමටත් මේ පවුලේ සැමට බාහිර බලපෑම් කොතෙක් ඇති වුවත්, පෙර කල පින් තිබූ ඔවුන් ඒ සියළු බාධා අභිබවා ගුණ යහපත් බොදු පවුලක් බවට පත් විය. මිල මුදල් ඉපැයීමත් ලෞකික සම්පත් අගය කිරීමත් නුරු පුරුදු කල සාම්ප්‍රදායානුකූල තරුණ පිරිස් අතරින් සැබෑ ජීවිතය වටහාගන්නට උත්සහ කල මේ තරුණ කුමරුවා, කලාණමිත්‍රයන් වහන්සේලාගේ අඇසුර ප්‍රිය කරන්නට යොමු වූයේ පෙර සසරේ පුරුදු පුහුණු කල ගුණාංග නැවත මතු වීම සිහිගන්වමිනි.

සියළු බාධා මැද දෙමව්පිය අවසරය ලබා ගෙන, පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණාන්ද නමින් පැවිදි බව ලැබූ ඒ කාලයාණමිත්‍රයාණන් වහන්සේ, විශ්ව විද්‍යාල අධ්‍යාපනද පසෙක තබා, ඉතා කෙටි කලකින් සියළුම බුද්ධ දේශනා අධ්‍යනය කිරීමටත්, නැවත නැවතත් සිහි කරමින් තියම හරය වටහා ගැනීමටත් ඇති සහජ හැකියාව අතිශයින් ම ශ්‍රේෂ්ඨය.

පැහැදිලි ශ්‍රී සද්ධර්මය වෙනුවට වර්ථමානයේ ඇති මිත්‍යා ඇදහීම් සහ බුදු දහමේ නාමයෙන් යුතු විකෘති දේශනා උන් වහන්සේ ගේ හද මඩල කම්පා කරවන්නට විය. දිවයින පුරා ඇති විහාරස්ථානවල උගත් ස්වාමීන් වහන්සේලාගේ උපදෙස් අනුශාසනා සහ ධර්ම පුස්ථක පරිශීලනය කරමින්, නිර්මල බුද්ධ වචනය සොයමින් අපගේ කලාණමිත්‍රයාණන් වහන්සේ අවබෝධ කමින් මග බුදුන් උපන් දේශය දක්වා දිව ගියේ, -කිරට හඬන කිරි දරුවෙකු සේ" දහම් පිපාසයට පිළිතුරු සෙවීමේ අවංක චේතනාවෙනි.

දහසකුත් එකක් බාදා මැද, ඉන්දියාවේ විවිධ ප්‍රදේශයන් හි විවිධාකාර පුද්ගලයන් ඇසුරු කරමින් නිර්මල බොදු වදන් සොයා ගිය උන්වහන්සේ නැවතත් හෙළ බිමට වැඩම කළේ, පැහැදිලි තිරවුල් ධර්ම දේශනා නොකිලිටිව, නොකැළල්ව තවමත් මේ දිවයිනේ ඇති බව ප්‍රායෝගිකව වටහා ගැනීමෙනි.

දාන, ශීල, භාවනා ආදී ගුණ දහම් වෙනුවට, විවිධාකර මිත්‍යා මත සහ දේව ඇදහිලි ආදියටත් මුල් තැන දෙමින්. බුද්ධ දේශනාවේ නාමයෙන් විකෘති දේශනා ඉදිරිපත් කරමින් සිටින වත්මන් පිරිහුන සමාජය තුළ නිර්මල බුද්ධ දේශනා යලි මතු කර ගන්නට අපගේ අති පූජණීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ තුළ තිබූ අප්‍රතිහත ධෛර්යට අපගේ නමස්කාරය වේවා !

මේ කාලය වන විට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා සුදුසු ස්ථානයක් සොයමින් සිටි පින්වත් කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ, මිට වසර 11කට පමණ පෙර පොල්ගහවෙල නගරය ආසන්නයේ වඩුවාව ප්‍රදේශයේ නිසංසල ග්‍රාමීය පරිසරයක මහමෙව්නාව භාවනා අසපුව ස්ථාපනය කරන ලදී.

ඉතා සුළු පිරිසකගේ සහයෝගය ඇතිව අරඹූ මහමෙව්නාව භාවනා අසපුව වෙත දහම් දැනුම සොයා එන පිරිසගේ යහපත පිණිස දහම් දැනුමින් යුතු, උගත් සිල්වත් ස්වාමීන් වහන්සේලාගේ අවශ්‍යතාවය මේ වන විට ඉතා තදින් දැනී තිබුනි. කාලීන අවශ්‍යතාවය මේ බව හඳුනාගත් පින්වත් කලාණ මිත්‍රයාණන් වහන්සේ, උගත් තරුණ ස්වාමීන් වහන්සේලා පැවිදි කරවා, දහම් දැනුමින් පෝෂණය කර, පරිපූර්ණ ධර්මධර, විනයධර පින්වත් ස්වාමීන් වහන්සේලා ලෙස, මේ ගෞතම බුදු සසුනට පූජා කරන ලදී. මේ වන විට හයසිය ගණනකට අධික ඒ පින්වත් තරුණ ස්වාමීන් වහන්සේලා, ලොව දසදෙස දහම් දැනුමින් සුවඳවත් කරමින් සඳහම් චාරිකාවේ යෙදෙයි.

සමස්ථ ලෝකවාසී සැදැහැවත් බොදු ජනතාවගේ සහයෝගය ඇතිව දිවයින පුරා, මහමෙව්නාව භාවනා අසපු ශාඛා 40 කට අධික සංඛ්‍යාවක් ආරම්භ කිරීමත්, ජාත්‍යන්තර වශයෙන් දහම් ප්‍රචාරක කටයුතු වල පහසුව පිණිස, ඔස්ට්‍රේලියාව, ඇමරිකාව, කැනඩාව, එංගලන්තය සහ මැදපෙරදිග ඇතුළු ලෝකයේ දස දිශාවල මහමෙව්නාව භාවනා අසපු පිහිටුවීමත් සඳහා බලන විට, පෙර රජ දවසින් පසුව බිහි වූ අති විශාලතම ධර්මප්‍රචාරක ව්‍යාපෘතිය මෙය බව කිසිම සැකයක් නැත.

දහම් දැනුමෙන් මෙන්ම, භාෂා දැනුමේ ප්‍රතිපූර්තියක් වන් පින්වත් කලාණමිත්‍යාණන් වහන්සේ පාලි භාෂාවෙන් ඇති ශ්‍රී සද්ධර්මය සරල සිංහල භාෂාවට පරිවර්තනය කරන්නේ, අබමල් රේණුවක තරම්වත් හානියක් නිර්මල බුදු වදනට හානි නොවන ආකාරයකි. "වරග කිත්බවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය" යන බුදු වදන ඒ අයුරින්ම අනුගමනය කරමින්, එක තැනක නොරැඳී, සඳහම් චාරිකාවේ යෙදෙමින් ගෞතම බුදුරජාණන් වහන්සෙ-"ගේ ශ්‍රී සද්ධර්මය ලෝකවාසි සැදැහැවත් බෞද්ධ ජනතාවට දේශනා කරමින්, මනා හික්මීමකින් යුතු තරුණ පින්වත් ස්වාමීන් වහන්සේලා බුදු සසුනට දායාද කරමින්, අති පූජණීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ අද ඇති කරගෙන යනු ලබන ශාසනික පුනරුදය වටා ලක්ෂ සංඛ්‍යාත සැදැහැ සිත් ඇති බෞද්ධ ජනතාව එක් රොක් වන්නේ, උන්වහන්සේ තුළ ඇති නිර්මල බුදු දහම ප්‍රවලිත කිරීමේ පරම පවිත්‍ර අවංක චේතනාව හඳුනාගත් නිසාය.

අතිපූජනීය ගෞරවනීය පින්වත් ලොකු ස්වාමීන් වහන්සේගේ අවවාද අනුශාසනා ඇතිව දැනට අවුරුදු 3කට පමණ පෙර, සිඩ්නි නගරයේ මහමෙව්නාව භාවනා අසපු ශාඛාවක් පිහිටුවනු ලැබීය. එයට සමගාමීව, මෙල්බර්න් නගරයේත් මහමෙව්නාව භාවනා අසපු ශාඛාවක් පිහිටවූ අතර, මෙම ශාඛාවන් දෙකෙහිම නේවාසික පින්වත් ස්වාමීන් වහන්සේලා, අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමින් වැඩ වාසය කරයි.

ඕස්ට්‍රේලියානු වාසි සැදැහැවත් බොදු ජනතාවගේ සිහිනයන් සැබෑ කරවමින් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා අපගේ කාලාණ මිත්‍රයාණන් වහන්සේ නොවැම්බර් මාසයේ 3 වැනි දින සිට 9 වැනි දින දක්වා මෙල්බර්න් නගරයේත්, 9 වැනි දින සිට 14 වැනි දින දක්වා සිඩ්නි නගරයේත් සඳහම් වැඩසටහන් කිහිපයකට සහභාගි වීමට නියමිතය.

කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ ධර්මදේශනා වැඩ සටහන්වලට සහභාගි වී මෙලොව දියුණුවත්, පරලොව යහපතත් උදා කරගන්නා මෙන් සැදැහැ සිතින් ඉල්ලා සිටින අතර, සියළුම දෙවිවරුන්ගේ රැකවරණයෙන් උන්වහන්සේගේ ධර්මප්‍රචාරක කටයුතු තව තවත් සාර්ථකව කරගෙන යාමට ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

විශේෂ ලියුම් කරුවෙකු විසිනි